# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2040/11 - 2017 ඔක්තෝබර් මස 10 වැනි අඟහරුවාදා - 2017.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර.*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරී පත්තුව සුළු කොට්ඨාශය ගොංගිතොට ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති මූලික පිඹුරු අංක 4053 සහ 2017.06.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0659 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ලට;

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 3ක්, වැසිකිලියක් සහ මුරකුටියක් ඇත. ගොංගිතොට පොලිස් මුර පොල පිහිටා ඇත; හිමිකම් කියන අය: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; ප්‍රමාණය: හෙක්. 0.0659.

ඉහත සඳහන් *ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 21 වැනි දින පෙ.ව. 9.30 ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 නොවැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර කොට්ඨාසය.

2017 ඔක්තෝබර් මස 04 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 892



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: උදු 2/2/10/113.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය.*: එල්.ඩී./05/2006/වීර්/335.

ඉහත ශීර්ෂ යටතේ 2017.02.28 අංක 2008/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* මවිසින් පල කරන ලද දැන්වීමේ සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් දිනයන් ආදේශ කර එම දැන්වීම පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ යුතු දිනයන් වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
| --- | --- |
| 2017.04.17 | 2017.11.16 |
| 2017.04.24 | 2017.11.23 |

සුජානී ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

10 - 893

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.